www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කොරසොන් කොජුඅන්ග්කො අක්විනෝ, 1933-2009

## Corazon Cojuangco Aquino, 1933-2009

**ජෝසප් සන්තොලන් විසිනි**

**2009 අගෝස්තු 5**

මෙය කොටස් දෙකකින් යුක්ත ලිපියක 2 වන කොටස ය.

### නිනොයි අක්විනෝ ඝාතනය

1981 වසර ආර්ථික අර්බුදයෙන් බැට වැදී තිබින. 1970 දශකයේ දී පිලිපීන ආර්ථිකය යන්තම් නොගිලී තිබුනේ අමු ද්‍රව්‍යවල ජාත්‍යන්තර මිල වැඩිවීමත්, ඇමරිකානු සහ බහු පාර්ශ්වීය නය දෙන ආයතන වලින් ලැබුනු සහයන් නිසාත් ය. දැන් මාකෝස්ගේ සහචරයන් විසින් පවත්වාගෙන ගිය විවිධ ව්‍යවසායන් හි බොල් නය ත්, නය පොලී ගෙවීමේ ප්‍රමානය මත ඇමරිකානු ඩොලරය අධි ප්‍රමානය වීමේ බලපෑමත් පිලිපීන ආර්ථිකයේ කැපී පෙනෙන සුලු සංකෝචනයක් ඇති කලේය. ඒ දක්වා මාකෝස්ට ශේෂව පැවති මධ්‍යම පන්තික සහයෝගය අතුරුදහන් විය.

ව්‍යාධියෙන් පෙලුනේ ආර්ථිකය පමනක් නොව මාකෝස් ද දද වැනි සමේ රෝගයකින් පීඩා වින්ද අතර මරනයට ගොදුරු වෙමින් සිටියේ ය. මෙය දැනගෙන සිටියේ මාකෝස් ඇසුරු කල ඉතාමත් සුලු පිරිසක් පමනි. මහජනයා ඉදිරියේ මාකෝස් ප්‍රසිද්ධියේ පෙනී සිටීම කලාතුරකින් සිදු විය. ඔහු ඉතා සෙමින්, තතනමින් කථා කලේ ය. ඔහු කිට්ටුවෙන් ඇසුරු කලවුන් අතර මාකෝස්ගෙන් පසු අනුප්‍රාප්තිකයා විය යුත්තේ කවුද යන්න පිලිබඳව බල අරගලයක් පැවතුනේය.

මාකෝස් ගෙන් පසු එතනට තමා පත්වීමේ අවශ්‍යතාවය ආරක්ෂක ඇමති සහ යුද නීතියේ සැලසුම්කරු වූ එන්රයිල් ට කලක සිටම තිබුනේ ය. මාකෝස්ට වෙනත් සැලසුම් තිබින. එනම් ඉමෙල්ඩා අනුප්‍රාප්තිකයා කිරීම ය. ඔහුගේ මෙම උත්සුකතාවයන් ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් මාකෝස් විශ්වාසය රඳවා තිබුනේ ඔහුගේ මෘග හෙන්චයියකු වූ ජෙනරාල් වේර් කෙරෙහි ය. ඉලොකොනෝ හමුදා සෙබලෙකු වූ මොහු මාකෝස්ගේ පෞද්ගලික ආරක්ෂකයෙකුව සිට ඔහුගේ පාලන කාලය තුල දී පිලිපීන හමුදාවේ ප්‍රධානියා බවට පත් විය. ද්‍රෝහී එන්රයිල් වෙනත් ආකාරයකින් බලය අල්ලා ගැනීමේ කුමන්ත්‍රනය පටන් ගත්තේ ය.

මාකෝස්ගේ රෝගී තත්ත්වය සහ ආසන්න වසයෙන් සිදු විය හැකි ඔහුගේ මරනය ගැනත් කටකථා පැතිර ගියේ ය. මේ වන විට බොස්ටන්හි පිටුවහලේ සිටි නිනොයි අක්විනෝ මෙම කටකථා ඇසූ පසු පිලිපීනයට පැමින ජනාධිපතිවරනය පැවැත් වූ විට ඊට සහභාගි වීමට තීරනය කලේ ය. 1983 අගෝස්තු 21 දා අක්විනෝ මැනිලාවට ගොඩ බැස්සේ ය. පඩිපෙල දිගේ ගුවන් තොටුපොලේ ධාවන පථයට බහිනවාත් සමග ම ඔහුගේ ඔලුව පිටුපසට වෙඩි තබන ලදී.

දඩමීමකු වෙත චෝදනා එල්ල විය. ආරක්ෂක භටයන්ගේ වෙඩි පහරවලින් සිදුරු වූ ඔහුගේ සිරුර අක්විනෝගේ පසෙකින් වැතිර තිබුනි එහෙත් අක්විනෝගේ ඝාතනය සඳහා මාකෝස් තන්ත්‍රය නියෝගය දෙන ලද බව හැම කෙනෙක්ම දැන සිටියේ ය. පැහැදිලිව ම මෙම සිද්ධිය පිටුපස ඉමෙල්ඩා සහ වේර් සිටියහ. බලය මත ඔවුන්ගේ ග්‍රහනය තබා ගැනීම කෙරෙහි ඔවුහු අධිෂ්ඨානශීලී වූහ.

කොරසොන් අක්විනො තම ස්වාමියාගේ අවමංගල්‍යට පිලිපීනයට පැමිනියා ය. දේශපාලන විචක්ෂන භාවයක් පෙන් වූ ඇය, තම ස්වාමියාගේ මල සිරුරෙහි කිසිදු වෙනසක් නොකිරීමට උපදෙස් දුන් අතර, ලේ තැවරුනු සිරුර විවෘත මිනී පෙට්ටියක තබා ප්‍රදර්ශනය කලා ය. මිලියන දෙකක් පමන ජනයා සහභාගීවූ නිනොයි ගේ අවමංගල්‍ය පෙරහැර මාකෝස්ට එරෙහි දේශපාලන පෙලගැස්මක් විය.

නිනොයි ඝාතනයෙන් පසු මතුවෙමින් පැවැති උද්ඝෝෂන පාලනය කිරීමට වෑයම් කිරීම සඳහා සංවිධානයක් ගොඩ නගන ලදී. මෙය මාකෝස් විසින් පිලිපීන ආර්ථිකය කොල්ල කෑමට එරෙහි ජාතික ධනපති පන්තියේ උත්සුකතාවයන් නියෝජනය කල නමුත් කම්කරු පන්තියේ බලය

සහ සමාජවාදී විප්ලවයේ ශඛ්‍යතාවය ගැන භීතියට පත් විය. අක්විනෝ සඳහා යුක්තිය, සියල්ලන්ටම යුක්තිය (ජේ.ඒ.ජේ.ඒ) යනුවෙන් හඳුන්වනු ලැබූ සංවිධානය පිලිපීන කම්කරු පන්තිය ද ගොවි ජනතාව ද මාකෝස් විරෝධය පිටුපස බල මුලු ගැන්වූ නමුත්, ඔවුන් (කම්කරු පන්තිය හා ගොවි ජනතාව) තමන්ගේ පන්ති අවශ්‍යතාවයන් ඉස්මතු කිරීමෙන් වලකනු ලැබුවේ ය. ජේ.ඒ.ජේ.ඒ ය දෛනික පදනමක දෝලනය වූයේ ය.

## "මහජන බලය"

මැතිවරනය පැවැත්වීමට නියමිත ව තිබුනේ 1986 පෙබරවාරි මාසයේ දී වුවත් ජාත්‍යන්තර සහ දේශීය පීඩනයන යටතේ මාකෝස්ට 1985 අග භාගයේ දී හදිසි මැතිවරනයක් පැවැත්වීමට බල කෙරුනේය. විරුද්ධ පාර්ශ්වයේ පවුල් අතර එකිනෙකාගේ තරගය නිසා සංයුක්ත වැඩ පිලිවෙලක් ඉදිරිපත් කිරීමෙන් ඔවුන් වැලකෙන බවත්, ඒ කෙසේ වෙතත් තමන්ට මැතිවරන ප්‍රතිපලය පාලනය කල හැකි බවත් මාකෝස් ට දැඩි විශ්වාසයක් තිබුනේය. පිලිපීන කතෝලික පල්ලියේ ප්‍රධානියා වූ **එයින්** කාඩිනල් සින්ගේ බලහත්කාර කඩා වැදීම නොතිබුනේ නම් ඔවුන්ගේ ගනන් බැලීම් නිවැරදිවීමට ඉඩ තිබුනි.

කාඩිනල් සින් 1970 සිට 2005 දක්වා පිලිපීනයේ දුෂ්ට සංකේතය විය. ඔහු රජුන් තනන්නෙකු සහ දක්ෂ ලෙස ගනන් බලා දේශපාලන උපාමාරු දමන්නෙකු විය. ඔහුගේ නිර්දේශයට දේශපාලන අපේක්ෂකයකු නිර්මානය කල හැකි විය. ඔහුගේ අප්‍රසාදයට දේශපාලන වෘත්තිකයකුට විනාශය කැටිය හැකි විය. විරුද්ධ පාර්ශ්වයේ හැල හැප්පිලි වලට මැදිහත් වෙමින් කාඩිනල් සින් පීඩාවට පත් වූ වැන්දඹුව වූ කොරි ජනාධිපතිකමට තරග කල යුතු බවත් ඇයගේ ප්‍රධාන ප්‍රතිමල්ලවයා වූ සැල්වදෝර් ලෝරල් උප ජනාධිපති අපේක්ෂකයා ලෙස සේවය කල යුතු බවත් නියෝග කලේ ය.

1986 පෙබරවාරි මැතිවරනය තුල මාකෝස්ගේ විවෘත ඡන්ද වංචාව කොතරම් ද කියතොත් ආඥාදායකත්වයේ කුරිරු ප්‍රමිතීන්ගෙන් ගත් කල ද එය ඉතා ඉහල ය. හොර ඡන්ද දමන ලදී. ඡන්ද ලැයිස්තුවලින් මිලියන සංඛ්‍යාත නම් අතුරුදහන් කරන ලදී. දැවැන්ත වංචාවන් තිබිය දීම අක්විනෝ ජයග්‍රහනය කර තිබූ බව පැහැදිලිය.

මාකෝස් ජයග්‍රහනය ප්‍රකාශයට පත් කලේ ය. අක්විනෝගේ ප්‍රතිචාරය ජාතික ධනපති පන්තියේ දුබලකම පිලිබඳව පැහැදිලි නිදසුනකි. ඇය මාකෝස්ගේ සහචරයින්ගේ සමාගම් වර්ජනය කරන ලෙස කැඳවුම් කලාය. ඇයගේ ආධාරකරුවෝ තව දුරටත් මාකෝස්ගේ සහචර සමාගම් වල නිෂ්පාදිත භාන්ඩ මිලදී ගැනීම ප්‍රතික්ෂේප කලහ. සියලුම විදුලිබලය සහ විදුලි සංදේශය ඇතුලු පුලුල් පරාසයක ඇති නිෂ්පාදිත මත බහුතරයක් සහචරයන් ඒකාධිකාරය උසුලන රටක මෙම කැඳවුම බෙලහීන කම ප්‍රදර්ශනය කලා පමනක් නොව කල නොහැකි දෙයක් ද වූයේය.

කෙසේ වෙතත් මෙය තමන්ට බලය ලබා ගැනීමට මහඟු අවස්ථාවක් ලෙස එන්රයිල් දැකගත්තේ ය. හමුදාව මත මාකෝස්ගේ අධිකාරය බිඳ විසිරී ගොස් තිබින. මාකෝස්ගේ ජනවාර්ගික ඥාති සංග්‍රහය මගින් තමන් පරයා උසස් වීම් දීම ගැන කුපිත වී සිටි මධ්‍යම පෙලේ සහ කනිෂ්ඨ නිලධාරීහු ඒකාධිපතිවාදයේ අඛන්ඩතාවයට එරෙහි වූ අසංතුෂ්ටියට පත්වූවන්ගේ කන්ඩායමක් ගොඩ නගා ගන්නා ලදහ.

මෙම දක්ෂිනාංශික හමුදා කල්ලියට ප්‍රජාතන්ත්‍රවාදය හෝ කොරසොන් අක්විනෝගේ ජයග්‍රහනය පිලිබඳ උත්සුකතාවක් තිබුනේ නැත. ඔවුන්ගේ අභිලාශය වූයේ හමුදාව විනයගත කිරීමක් වන හෙයින් ඔවුන් දැක්කේ මාකෝස්ගේ අයථා පක්ෂපාතකම මිලිටරියේ බලයට කාර්යක්ෂමභාවයට යටින් වල කපනා බව ය. එන්රයිල් සහ මාකෝස්ගේ දෙවන ඥාති සහෝදරයකු වන ෆිදල් රාමොස් මෙම විරෝධතාවය සංවිධානය කලහ. මැතිවරනයෙන් අනතුරුව ඇති වූ ව්‍යාකුලතාවය තුල දී මැනිලා අගනුවරෙහි දෙපසට ම යා හැකි ප්‍රධාන මාර්ග දෙකෙහි පිහිටි එපිෆනියො ඩි ලොස් සන්තොස් ඇවනිව් එඩ්සා හි හමුදා මධ්‍යස්ථාන දෙකක් අල්ලා ගත්හ. එන්රයිල්ගේ අභිලාෂය වූයේ මාකෝස් නෙරපා හැර තමන් ම අගමැති බව ප්‍රකාශ කිරීම ය.

මාකෝස් රෝගාතුරව හෙම්බත් වී සිටියේ ය. ඔහු මහජන නැගිටීමට ක්ෂනිකව මුහුන දීමට අපොහොසත් විය. පැය 24 ගත විය. වැඩි වැඩියෙන් හමුදාව පලා යන තතු යටතේ සින් කාදිනල්වරයා නැවතත් මැදිහත් විය. ඔහු කතෝලික පල්ලිය සතු රේඩියෝ වෙරිටාස් මගින් ආමන්ත්‍රනය කරමින් කුමන්ත්‍රනකරුවන් මහජන මුරවලල්ලකින් වට කරන ලෙසත් එඩ්සා වෙත ජන ගංගාවක් නිර්මානය කරන ලෙසත් කොරි ආධාරකරුවන් ට කැඳවුම් කලේ ය. දස දහස් ගනන් පිලිපීන ජනතාව මෙම කැඳවුමට ප්‍රතිචාර දැක්වූහ. කුමන්ත්‍රනයට එරෙහිව අවසානයේ දී මාකෝස්

යුධ ටැංකි යැවූ විට ඒවාට බාධා වන පරිදි විරෝධතාකරුවන් විසින් මාවත් අසුරා තිබින. යුධ ටැංකි ඉදිරියේ දන ගසාගෙන සිටි නිරායුධ (ක්‍රිස්තියානි) කන්‍යා සහෝදරියන්ගේ විශ්මය දනවන ඡායාරූප ජාත්‍යන්තර ජන මාධ්‍යයන් විසින් සැපයූ මෙම සිද්ධිය "මහජන බලය" ලෙස හඳුන්වනු ලැබීය. යුධ ටැංකිවලට වෙඩි තැබීමේ නියෝග දීමට වෙර් ට අවශ්‍ය වූ නමුත් නැවතත් මාකෝස් අදිමදි කලේ ය.

මාකෝස් සමග තිබූ රීගන්ගේ කිට්ටු සබඳතා ගැන ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ බොහෝ දෙනෙක් කාලයක් පුරා අප්‍රසාදය පල කර සිටියහ. මහජන සබඳතා සම්බන්ධයෙන් ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේමෙන්ම ව්‍යාපාර සඳහා ද මාකෝස් සුදුසු නොවීය. සහචරයින් විසින් පාලනය කෙරෙන ව්‍යාපාර ද, පැතිර පවතින දූෂනය අල්ලස් ගැනීම් ද බොහෝ දෙනෙක් ක්‍රියාත්මක කල යුතුය යන්න අපේක්ෂා කල නව ලිබරල්වාදී නිදහස් වෙළඳපොල ප්‍රතිපත්ති වලට බාධාවක් වී තිබින.

කැලිෆෝනියාවේ ආන්ඩුකාරයා ලෙස රොනල්ඩ් (තම බිරිඳ වූ) නැන්සි සමග රාජ්‍ය සංචාරයක් සඳහා 1960 දශකයේ පිලිපීනයට ගිය තැන් පටන් ඔවුහු මාකෝස්වරුන්ට ඉතා සමීපව සිටියහ. නැන්සි සහ ඉමෙල්ඩා සමහර විට එකිනෙකා සමග සෑම සතියකම වාගේ දුර කථනය මගින් කථාබස් කලහ. 1980 දශකයේ පිලිපීනයේ සංචාරයක යෙදී සිටි උප ජනාධිපති බුෂ් ප්‍රසිද්ධියේ මාකොස්ගේ "ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට" ඇති බැඳීම ගැන සව්දිය පිරීය. 1986 පැවැත්වූ හදිසි මැතිවරනයෙන් පසුව රීගන් පුවත්පත් සාකච්ඡාවක දී ප්‍රකාශ කලේ "පැති දෙකෙන් ම සිදු වූ" හිංසනය හා වංචාවන් තිබුනු බව ය.

පෙබරවාරි මස සිද්ධීන් දිග හැරෙද්දී, රීගන්ගේ සමීප උපදේශකයෝ ද මාකෝස් අත හැර දැමූහ. පෙබරවාරි මස 25 ඉරිදා ධවල මන්දිරයේ පැවැති රැස්වීමක දී ජ්‍යෙෂ්ඨ උපදේශකවරුන් වූ ෂුල්ට්ස්, වොල්ෆොවිට්ස්, ආර්මකොස්ට් සහ පොයින්ඩෙක්ස්ටර් මාකෝස් බලය අත් හල යුතු බවට තර්ක කලේ ය. සීඅයිඒ අධ්‍යක්ෂක රොබට් ගේට්ස් ද ආරක්ෂක ලේකම් කැස්පර් වෙයින්බර්ගර් ද මාකොස් සමග විරසක වූහ. රීගන් ද එය ම කලේය.

බොහෝ සාකච්ඡා කිරීමෙන් පසුව මාකෝස්ට ඇමරිකාව තුල පිටුවහල් තත්ත්වය ලබා දිය යුතු බවට තීරනය කෙරින. පනිවිඩය මාකෝස්ට යැවීමෙන් අනතුරුව, පෙබරවාරි 26 දා පස්වරු 9.00 ට හෙලිකොප්ටර් යානා 4ක් මගින් ඔහුත්, ඉමෙල්ඩාත් ඔවුන්ගේ ළමයින් සහ වෙර් ද රටෙන් පිට කරන ලදී. සින්ගේ උපායයන්ට පිංසිදු වන්නට ජනාධිපති ලෙසට ප්‍රකාශ කිරීමට සැදී පැහැදී සිටි අක්විනෝට ඇමරිකාව තම සහය දුන්නේ ය. අක්විනෝ යටතේ එන්රයිල් ආරක්ෂක ඇමති තනතුර භාර ගත්තේ ය.

## අක්විනෝ ජනාධිපතිත්වය

ඒකාධිපතියකුගේ නෙරපා හැරීම සෑම විටම හුවා දක්වනු ලැබුවේ අක්විනෝගේ උත්කෘෂ්ට නිපුනත්වයක් ලෙස ය. ඇය පිලිපීනයේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කල බව සියලුම ශෝක ප්‍රකාශ මගින් කියා පෑවේ ය. ඇය ශ්‍රේෂ්ඨ ජනාධිපතිනියක් බව ඔවුන් පිලිගන්නේ නැති නමුත් "බලයට තල්ලු වූ සරල ගෘහනියකු" ගෙන් බලාපොරොත්තු විය හැක්කේ කුමක් ද?

මෙය මිථ්‍යාව වැමෑරීමේ තකතීරුකම හැර අනෙකක් නොවේ. හමුදා කුමන්ත්‍රනයත් ප්‍රමුඛ පූජකයකුගේ දේශපාලන කූට උපක්‍රම සහ ඇමරිකානු ආන්ඩුවේ කල් පසුව සිදු කෙරුනු මැදිහත් වීම මගින් මාකෝස් පාලනයෙන් ඉවත් කරන ලදි.

"මහජන බලය" පිලිපීන දේශපාලනයේදී ඇස් බැන්දුම් වැදගත් කමක් ලබාගෙන ඇත. මේරියන්ගේ කැපවීමත් පන්ති විභේදනයකින් තොරව එඩ්සා සහ ඔරිගන්හි මහජන ඒකරාශි වීමත් අතර අපූර්ව සංයෝගයක් මගින් පිලිපීන සමාජයේ සැලකිය යුතු වෙනසකට තුඩු දෙනු ඇතැයි යන අදහස් පෙනෙන්නට තිබේ.

කෙසේ වෙතත් මෙය එකම මිත්‍යාව නොවේ. ජනාධිපතිකමට ඉදිරිපත් වන විටත් අක්විනෝ "සරල ගෘහනියක්" නොවීය. ඒකාධිපතියෙකුට එරෙහිව යුක්තිය විසින් පොලොඹවනු ලැබූ සරල ගෘහනියක් ලෙස ඇය ඇයගේ උද්ඝෝෂනය තුල දී තමන්ව ම හුවා දැක්වූ බව ඉතාමත් පැහැදිලි ය. එය බලගතු චිත්‍රයක් වූ නමුත් සත්‍යයෙන් තොර ය.

ජනාධිපතිවරනය සඳහා ඉදිරිපත් වන විටත් කොරසොන් අක්විනො කොජුඅන්ග්කො අධිරාජ්‍යයේ භාන්ඩාගාරික වී සිටියා ය. ඇය උපක්‍රමශීලී හා කපටි වූ ද, බලය සඳහා ඇබ්බැහි වූ ද, ධනය උපයා ගැනීමටත් එය පවත්වාගත හැකි වූත් කාන්තාවකි. ආගම කෙරෙහි ඇය ඉතා භක්තිමත්ව සිටියා ය.

ජනාධිපතිවරනය සඳහා ඇයට මෙය මනෝබද්ධ පදනම සැකසීය. ඉඩම් හිමි

ව්‍යාපාරිකාවක් වීමේ. මානසිකත්වයක් ඇයට තිබින. ඇය හෙක්ටයාර් දහස් ගනනක හිමිකාරියක් ද, සම්ප්‍රදායික කතෝලික මනෝ විහිතියක් ද ඇත්තියකු වූවාය.

පෙර ශතවර්ෂය පුරා ස්පාඤ්ඤ කරනයට භාජනය වූ චීන මෙස්ටිසෝ කතිපයාධිපතියෝ වෙනස් වීමකට ද භාජනය වූහ. චීන පෙලපතට තිබුනු කවර හෝ බැඳීමක් සිතාමතාම අකාමකා දමන ලදී. ස්පාඤ්ඤ උරුමය පැවතියේ කැස්ට්ලියානු විශේෂ විලාසයක මවාපෑමක පමනි - එනම් කතිපයාධිපතියෝ තවමත් තමන් ඩොන්වරු සහ ඩෝනාවරු ලෙස හැඩ ගස්වාගෙන සිටියහ.

පිලිපීනය තුලත් පිටරටත් යන දෙකෙහිම මූල්‍ය සහ කාර්මික ධනවාදයේ හැකි සියලුම දේවල් මිලදී ගැනීමත් සමග වතු ඉඩම් දේපල සමග ඔවුන්ගේ සබඳතා ක්‍රමානුකූලව බොඳවී ගියේ ය. ඔවුහු තවදුරටත් තමන්ගේ වතුවල පදිංචි නොවූහ. ඔවුන් පදිංචි වූයේ මැනිලාවල පිහිටි මන්දිරවල ය. මෙම ආඪ්‍ය මාලිගාවල් විසිරී තිබුනු පැල්පත් පෙදෙස් වලින් ද අධික දරිද්‍රතාවයෙන් යුක්ත ප්‍රදේශ වලින් ද වෙන් වනසේ ඉතා ඉහල මුරකාවල් වලින් ආරක්ෂා කර තිබින.

කොජුඅන්ග්කො වංශයේ උරුමය වූ කොරිගෙ මානසිකත්වය, තම ජනාධිපතිකමේ වෛෂයික පදනමට ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේ ද යන්න හැඩ ගැස්වීය. ඇය බලයට පැමිනියේ ප්‍රතිවිරෝධී පන්ති වලවේග වල අසම්පූර්න වූත් ආතති සහගත වූත් පදනමක් මතින් ය.

කුමන්ත්‍රන ප්‍රයත්නයකට සම්බන්ධ කනිෂ්ට නිලධාරීහු අක්විනෝ පරිපාලනයට සහයෝගය දීමේ එන්රයිල්ගේ පිලිවෙත අනුගමනය කලහ. ඔවුහු යුධ හමුදාව ප්‍රතිසංස්කරනය කිරීමටත්, උසස් වීම් අහිමි වූවන්ට කඩිනම් උසස් වීම් ලබා ගැනීමටත් මාකෝස්ගේ වකවානුව තුල වේගයෙන් වර්ධනය වී තිබුන කොමියුනිස්ට් පක්ෂය ද ක්‍රියාශීලීව බලමුලු ගැන්වුනු නාගරික කම්කරු පන්තියේ නව සංවිධාන වලට ද එරෙහි තියුනු කඩා පැනීම ක් සඳහාත් මාන බැලූහ.

මාකෝස්ගේ පාලන කාලය තුල බලයෙන් බැහැර කර සිටි සියලුම කතිපයාධිපති පවුල්වල සහයෝගය අක්විනෝට ලැබුනේය. ඔවුන්ගේ දේපල සහ දේශපාලන බලය ප්‍රතිස්ථාපනය කිරීමත් ඔවුහු බලාපොරොත්තු වූහ.

මාකොස්ගේ යුගයේ දී රටින් පිට යාගත නොහැකි වූ නාගරික මධ්‍යම පන්තියේ සාමාජිකයින්ගේ සහය ද අක්විනෝට ලැබින. ඔවුහු නැවතත් අපේක්ෂා කලේ වංචා දූෂනයෙන් තොර වූ කාර්යක්ෂම බටහිර පන්නයේ ප්‍රජාතන්ත්‍රවාදයක තාක්ෂනාධිපති කර්තව්‍යයකි.

කාඩිනල් සින් සහ කතෝලික පල්ලියේ සම්පූර්න සහයෝගය අක්විනෝට ලැබුනේය.

අවසානයේ දී, යම් ආකාරයක දියාරු ලෙස අර්ථ කථනය කරන ලද සමාජ ප්‍රජාතන්ත්‍රවාදී එල්ලයයන් හි දිශාවට ඇයගේ ප්‍රතිපත්ති හැරවීමේ බලාපොරොත්තුවෙන් සී.පී.පී - එන්පීඒ කෙරෙහි දීර්ඝ කාලයක සිට අපේක්ෂා භංගව සිටි සුලු ධනේශ්වර බුද්ධිමත්හු අක්විනෝ පරිපාලනය තුල දැන් තැනක් සෙවූහ.

ජනාධිපතිගේ පාලන කාලයේ පලමු වසර ගෙවෙද්දී ඇයගේ ජනාධිපතිකම ගොඩනැගූ සමාජ පදනම වූ පන්ති බලවේගයන්හි සන්ධානය වඩ වඩා එදිරිවාදී ගැටුම් වලින් දෙදරා ගියේය. අක්විනෝ සෑම කන්ඩායමක්ම සැනසීමට යාම අවසන් වූයේ එකිනෙකා අතර සෑම කෙනෙකුම සමග අමනාප වීම් වලිනි. කලකිරී සිටි හමුදා නිලධරයෝ ග්‍රෙගරි හොනසන්ගේ නායකත්වය යටතේ අතිශය ලේ වැකි වූ කුමන්ත්‍රන හතක් සිදු කලහ. 1986 අගභාගයේ ආරක්ෂක ඇමති කමෙන් ඉල්ලා අස් වූ එන්රයිල්ට කුමන්ත්‍රන කිහිපයක ම ඍජු සබඳතා තිබින.

කුමන්ත්‍රනවලට ප්‍රතිචාර ලෙස අක්විනෝ තම ආන්ඩුව වඩා දකුනට වාරු කලා ය. ඇය තම කැබිනට් මන්ඩලයේ තනතුරුවල සිටි සමාජ ප්‍රජාතන්ත්‍රවාදී බුද්ධිමතුන් ඉවත් කලා ය. ඇය ප්‍රති-කොමියුනිස්ට්වාදී පැරා මිලිටරි කන්ඩායම්, සහ සීඒඑන්ජීයූ (සිවිල් හමුදා භූගෝලීය ඒකක) යන නමින් හැඳින් වූ මැරවර හමුදා සංවිධාන ගොඩ නැගීම සඳහා රුකුල් දුන්නේ ය. පිලිපීන හමුදාවේ අරමුදල් මත යැපුනු පැරා මිලිටරි සෝදිසි කන්ඩායම්, හිරිහැර කිරීම් ත්‍රස්තවාදි කටයුතුවල, වධදීම් සහ ඝාතන වල යෙදී සිටියේ නිල ප්‍රති කොමියුනිස්ට්වාදයේ අනුග්‍රහය යටතේ ය. අක්විනෝ කුප්‍රකට ලෙස සීඒඑන්ජීයූ හැඳින්වූයේ "මහජන බලයේ නිදසුනක්" ලෙසය.

නාගරික මධ්‍යම පන්තියේ ඉඩම් ප්‍රතිසංස්කරන සඳහා ඉල්ලීම්වලින් පුවත් පත් පුරවනු ලැබුනේ ය. ඒ සමග ම ඔවුන්ගේ අරමුන වූයේ කතිපයාධිපතීන්ගේත්, ඉඩම් හිමියන්ගේ අපචාරයන්ට එරෙහි ව සාමාජිකත්වය ප්‍රසාරනය

වූ එන්පීඒහි බලය බිඳීම ය.

මෙහිදී අක්විනෝගේ සැබෑ පන්ති පාක්ෂිකත්වය ඉස්මතු විය. ඇය පුලුල් කෘෂිකාර්මික ප්‍රතිසංස්කරන වැඩ පිලිවෙල ( පුකෘප්‍රවැ) යන ව්‍යාජ නාමය යටතේ කුලු ගන්වනු ලැබූ උදාසීන ප්‍රයත්නයන් මාලාවක යෙදින. විශාල ඉඩම් හිමියෝ තම කුලී කරුවන්ට මෙම නීතිය යටතේ නැවත ඉඩම් බෙදා දීමෙන් වැලකී සිටියහ.

මහා ඉඩම් හිමියෝ ඔවුන්ගේ ඉඩම් වානිජ හෝ කාර්මික ඉඩම් ලෙස යලි වර්ගීකරනය කිරීම මගින් හෝ, ඒකාබද්ධ කොටස් අයිතියට හිමිකාරිත්වය මාරු කරමින් සහ අඳගොවීන්ට සුලු ඉඩම් කොටසක් දීමෙන් මෙම නව නීතිය යටතේ ඔවුන්ගේ ඉඩම් අඳගොවීන් අතර යලි බෙදා දීමෙන් මගහැරියහ.

කොජුඅන්ග්කො වරු තම ඉඩම් සම්බන්ධයෙන් ඉහත සඳහන් දෙකම කලහ. එයින් කොටසක් නැවත වාර්ගීකරනය කල ඔවුහු ඉතිරිය බද්ධ ව්‍යාපාර යටතට පැවරූහ. කෝරි තම පවුලේ ගෙවත්ත සහිත නිවහන තබාගත්තීය. එමෙන්ම නාගරික මධ්‍යම පන්තිය එම නිසා ක්‍රමානුකූලව අක්විනෝ ගැන මිථ්‍යාවන්ගෙන් මිදුනහ.

1987 ජනවාරි 22 දින ගොවියෝ 10,000 ක් අක්විනෝ පරිපාලනයෙන් අව්‍යාජ ඉඩම් ප්‍රතිසංස්කරන ඉල්ලීමට මෙන්ඩිඔල පාලම හරහා පා ගමනක යෙදුනාහ. ආරක්ෂක හමුදාව තැබූ වෙඩිවලින් ගොවීන් 13 ඝාතනය වූ අතර 50 තුවාල සිදුවූහ. මෙය මෙන්ඩිඔලා ඝාතනය යන නමින් පට බැඳින. අක්විනෝගේ එන්න එන්නම වැඩිවෙමින් පවතින සිත් පිත් නැති ආකල්පයත් කතිපයාධිපතියන්ගේ අවශ්‍යතාවන් ආරක්ෂා කිරීම සඳහා හිංසනය භාවිතා කිරීමේ කැමැත්තක් එමගින් මූර්තිමත් කලේ ය.

1987 මැයි මස මහා මැතිවරනය පැවැත්විනි. මහජන මන්ත්‍රී මන්ඩලයේ ආසන 200න්, 169 අධිකාරවත් පවුල් වල නියෝජිතයින් ට හිමි විය. මේවායින් 169ක් 1986 ට පෙරාතු මාකෝස් විරෝධී ව්‍යාපාරයේ සිටියවුන්ට ද හිමි වූ අතර 67 ක් මාකෝස් ගැත්තන්ට හිමි විය. මෙය "කතිපයාධිපති පාලනයේ කැලිඩස්කෝපය සෙලවීමකි". (බෙනඩික්ට් ඇන්ඩර්සන්, "කැසික් ඩෙමොක්‍රසි ඉන් පිලිපීන්ස්" හි *The Spectre of Comparisons* ද ස්පෙක්ට ඔෆ් කම්පරිසන්ස්, ලන්ඩන්, වර්සො, 1998, පි-222).

අක්විනෝ තම පාලන කාලය පටන් ගත්තේ ඇමරිකානු කඳවුරු සඳහා දීර්ඝ කිරීම් ලබා දීම් වලට විරුද්ධත්වය පෑ හැකියි යන ඇඟවීම ඇති කරමින්ය. 1991 නැවත බද්ද අලුත් කිරීම සඳහා කාලය එලඹී විට අක්විනෝ ආන්ඩුව, මුදල් සඳහා ඇති මංමුලාවෙන් අලුත් කිරීම සඳහා සාකච්ඡා කිරීමට කැමතිවිය.

ක්ලාර්ක් ගුවන් හමුදා කඳවුර විනාශ කරමින් හා ගිවිසුම අලුත් කිරීම වාද කල හැකි කරුනක් බවට පත්කරමින් 1991 ජුනි මස මව්න්ට් පිනටුබෝ ගිනිකන්ද පුපුරා ගියේය. ඇමරිකානු රාජ්‍ය නියෝජිතයින් සමග සුබික් නාවික කඳවුර දීර්ඝ කිරීම ගැන සාකච්ඡා කල නමුත් අක්විනෝ පරිපාලනය පිලිපීන සෙනේට් සභාව තුල නැවත සාකච්ඡා කරන ලද බද්ද සම්මත කර ගැනීමට අපොහොසත් විය. 1992 දී පිලිපීනයෙන් ඇමරිකානු නාවික හමුදාව ඉවත් ව ගියේ ය.

වැඩිවෙමින් පවතින දිලිඳු කම සහ පන්ති ගැටුම් අක්විනෝ පරිපාලනය තුල කැපී පෙනෙන සුලු විය. විදුලි බලය ඇන හිටීම් හා විදුලි සංදේශ පද්ධතියේ බිඳ වැටීම් නිරන්තරව ඇති විය. කතිපයාධිපත්‍යවාදී දේශපාලනය අඛන්ඩව ඉදිරියට ගියේ ය. අනෙකුත් අපේක්ෂකයින් අතර, 1992 මැතිවරනය තුලදී පැහැදිලි වූයේ, ඩැන්ඩින්ග් කොජුඅන්ග්කො, ඉමෙල්ඩ මාකෝස් සහ ෆිඩෙල් රාමොස් පාලනය සඳහා ඉදිරියට එන බව ය. කුඩා බහුතරයකින් රාමොස් ජනාධිපතිවරනයෙන් ජය ගත්තේ ය. එකම දේශපාලන නලුවෝම දේශපාලන කුටෝපායන් දිගටම කරගෙන ගියහ. එන්රයිල් දැන් සෙනේට් සභාවේ සභාපති විය, ග්‍රෙගෝරියෙ සෙනේට් සභිකයකු විය.

## සී.පී.පී, ධනේශ්වර ජාතිකවාදය සහ අවධි දෙකේ විප්ලව න්‍යාය

අක්විනෝගේ අභාවයත් සමග පිලිපීන මාධ්‍යයන් තුලින් ගලා එන ලද ප්‍රශංසාවන් විවිධ මූලාශ්‍රවලින් මතුවිය. සමහරකුට, කොරි ගැන තමන්ගේ ප්‍රශංසාවන් අවංක වූහ, එනම් ඉතිහාසය පිලිබඳව දූස් අධ්‍යාපනයේ ප්‍රතිපලයකි. ඔව්හු දැක්කේ අක්විනෝ බලයට පැමිනීම නිර්මල දේශපාලනික පිලිසිඳ ගැනීමක් ලෙස ය. ඇයව අනුස්මරනය කිරීමේදී ඔවුහු සමරන්නේ ජාත්‍යන්තර නිරීක්ෂකයින්ගේ කනස්සල්ලටත් සෝලියටත් හසු නොවූ පිලිපීන දිනයක් ලෙසය.

සෙසු අය සම්බන්ධයෙන් ගත් කල, කෝරි ට දක්වන ඔවුන්ගේ ආදරනීය සමුගැනීම වැදගත් සංසිද්ධීන්ට අතීත සහභාගිවීම පිලිබඳ ඓතිහාසිකව විකෘති මතකයකි. මෙය වත්මන්

ජනාධිපතිනිය වන ග්ලෝරියා මැකපගල් අරොයොගෙ ගොදුරු ඉදිරියේ බෙලහීන, සුලු ධනේශ්වරයේ ඓතිහාසිකව හිස් සහ පදනම් විරහිත හැඟීම්බර ආවර්ජනයයි. ඇය ආශ්‍වාදායක අභිලාෂයන් සහිත අඟුටුමිටි කටහැකර ප්‍රතිභාවක් හෝ අනුහසක් නැති මාකෝස් කෙනෙකි.

නමුත්, පිලිපීන කොමියුනිස්ට් පක්ෂයටත් එවැනි වර්ගයේ සෙසු අය සම්බන්ධයෙන් ගත් කල අක්විනෝගේ මරනය ඉදිරියේ පුද කරන ලද ප්‍රසංසාවන් ප්‍රති-මාක්ස්වාදී අවධි දෙකේ විප්ලවවාදී න්‍යාය මත පදනම් බංකොලොත් ප්‍රතිපත්ති ඉදිරියටම ගෙන යාමකි. 1986 පැවැත් වූ හදිසි මැතිවරනය තුලදී, එයට සහභාගි නොවී අක්‍රියශීලීව සිටින ලෙස සීපීපී ය මහජනයාගෙන් ඉල්ලා සිටියේ ය. ඔවුහු මාකෝස් හෝ අක්විනෝට එරෙහිව විකල්ප වැඩ පිලිවෙලක් ඉදිරිපත් නොකලහ. මැතිවරන වර්ජනය කිරීමේ මෙම කැඳවුම මහජනතාව ජාතික ධනපති පන්තියේ ත් අක්විනෝගේත් සෙවනැලි යටතට තල්ලු කලේ ය.

මැතිවරනයට පෙරාතුව සීපීපී ය පැවසුවේ මාකෝස්ගෙත් ඇකිනෝගෙත් කිසිදු වෙනසක් නැති බව ය. අක්විනෝ පාලනයට පිවිසි විට සීපීපී ය අක්විනෝ සමග සාකච්ඡා සඳහා උත්සුක විය. 1986 මැයි මස දේශන මාලාවක් පවත්වමින් ජොම සිසොන් තර්ක කලේ "සන්ධානයට" ත් "සභාග ආන්ඩුවත්" "අක්විනෝ ආන්ඩුවටත් විප්ලවවාදී බගවේගවලට"ත් "එකිනෙකාට වාසිදායක" විය හැකි බවය.

මෙම සභාග ආන්ඩුව අසාර්ථක වුවහොත්, ඔහු තව දුරටත් ප්‍රකාශ කලේ, "මධ්‍යම පන්තියෙන් බඳවා ගන්නා ලද නවක ආවතේවකරුවන් සහභාගි වන ඇමරිකානු අධිරාජ්‍යවාදීන්ට කීකරු ඉඩම් හිමියන්ගේ සහ නව මහ කොම්ප්‍රදෝරුවරුන්ගේ දේශපාලන ඒකාධිකාරයත් මහජනයා පෙලීම සඳහා පහවී ගිය ෆැසිස්ට් ඒකාධිපතියා විසින් උපයෝගී කර ගත් එම හමුදා බලය භාවිතය මගිනුත් ෆැසිස්ට් ඒකාධිපතිත්වයක් නැවතත් මතුවීමට සහ පසුව ආයුධ සන්නද්ධ විප්ලවවාදී ව්‍යාපාරයක ජයග්‍රහනයට ශක්‍යතාව වැඩිදියුනු කරන බව" ය. එනම් ඒකාධිපතිවාදය යලි මතුවීම විප්ලවයේ ජයග්‍රහනය සඳහා රුකුල් දෙයි.

1987 ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ පුරෝගාමියා වූ සමාජවාදී කම්කරු සංගමයේ මාධ්‍ය වූ *වර්කර්ස් නිව්ස්* පුවත් පතට ලියමින් නික් බීම්ස් පිලිතුරු දුන්නේ "සිසොන් සහ සී.පී.වීයේ දේශපාලනය වනාහි දෙගුනයකින් ප්‍රහල වූ විෂ පෙවීමකි." එක් අතකින් ඔවුහු අක්විනෝ තන්ත්‍රය පිලිබඳ ව මිත්‍යාවන් ඇතිකරති, පසුව හමුදා ඒකාධිපති වාදයේ අනතුර ඉස්මතුවී එන තතු තුල ඔව්හු එවැනි ඒකාධිපතිවාදයක් විප්ලවවාදී බලවේගවල ජය කඩිනම් කරයි යන න්‍යායක් මගින් කම්කරු පන්තිය නිරායුධ කරයි."

එඩ්සා හි මහජන ව්‍යාපාරයත්, ෆර්ඩිනන්ඩ් මාකෝස් නෙරපා හැරීමත් පිලිපීනය තුල බලය ලබා ගැනීම සඳහා කම්කරු පන්තියට මාවතක් විවෘතවීමේ හැකියාව තිබුනි. අවශ්‍ය වූයේ විප්ලවවාදී නායකත්වයකි. පලමුව පිලිපීන කොමියුනිස්ට් පක්ෂය (මැතිවරනයට) සහභාගි නොවන ලෙස ඉල්ලීය. පසුව, මෙය මහජනයා විසින් නොතැකූ තත්ත්වය යටතේ සීපීපීය උත්සාහ කලේ ධනපති නායකත්වය යටතේ කම්කරු පන්තිය රඳවා තැබීමට ය...."

සීපීපී ය අවධි දෙකේ ස්ටැලින්වාදී න්‍යායේ එල්ලී සිටියි. පිලිපීන විප්ලවයේ කර්තව්‍ය, එය පවසන්නේ, සමාජවාදී නොව, ජාතික ප්‍රජාතන්ත්‍රිකවාදී වන බවයි. පිලිපීනය, සීපීපීයට අනුව, අර්ධ වැඩවසම්වාදී, අර්ධ-විජිතවාදී රටකි. ඇමරිකානු අධිරාජ්‍යවාදය විසින් පිලිපීනය මත පසුගාමී තත්වයක් පටවා තිබේ. අධිරාජ්‍යවාදය නෙරපා හැරීම සහ පිලිපීනයේ කාර්මික සහ ප්‍රජාතන්ත්‍රවාදී සංවර්ධනයේදී ජාතික ධනපති පන්තිය විප්ලවවාදී කාර්යභාරයක් ඉටු කල යුතු ය.

මෙම ප්‍රතිපත්තියේ ඛේදජනක ප්‍රතිඵලවල නිදසුන් වලින් විසිවන සියවස ගහන වී ඇත. 1925-1927 දී ස්ටැලින් ජාතික ධනපති ක්වෝමින්ටෑනයට යටත් වන ලෙස චීන කොමියුනිස්ට්වරුන්ට නියෝග කලේ ය. ක්වෝමින්ටෑනයේ නායක චියැංග් කායි - ෂෙක් ෂැංහයි කම්කරු පන්තිය ඝාතනය කලේ ය.

1965 දී ඉන්දුනීසියාවේ දී ස්ටැලින්වාදී පීකේඅයි අවධි දෙකේ විප්ලවවාදී න්‍යාය මත සුකර්නෝගේ ජාතික ධනේශ්වර පරිපාලනය සමග සන්ධානගත විය.

සුකර්නෝ බලයට පැමිනිවිට එය නිරායුධ කරමින් පීකේඅයි සාමාජිකයින් 500,000 සිට 1,000,000 දක්වා මර්දනය පෙරට ගෙන ගියේ ය. පශ්චාත් දෙවන ලෝක යුද සමයේ දී ඉන්දියාව, සුඩානය, සහ ඉරාකය තුල මෙම මූලික ස්ටැලින්වාදී ප්‍රතිපත්තිය ඉහත ආකාරයේ ලේ වැකි ප්‍රතිපල ඇති කලේ ය. මෙම අවධි දෙකේ ස්ටැලින්වාදී

න්‍යාය තම පන්ති සතුරන් වූ ධනපති පන්තිය ඉදිරියේ කම්කරු පන්තිය නිරායුධ කලේ ය.

සීපීපී ය "ජාතික ප්‍රජාතන්ත්‍රවාදී" විප්ලවය ඉදිරියට ගෙනයා හැකි ධනේශ්වර කප්පිත්තෙක් සෙවීමේ මංමුලා සහගත ප්‍රයත්නයක යෙදී සිටියි. තම වාචාල දෙඩවිලිවලදී සීපීපීය අක්විනෝ ගැන විවිධ කථා කීවේ ය. මැතිවරනයට පෙරාතුව මාකෝස්ගෙන් අක්විනෝ වෙනස් නොවීය. සාම සාක්චිඡා තුලදී ඇය ශක්‍ය මිත්‍ර පාක්ෂිකාවක විය. සාම සාකච්ඡා බිඳ වැටුනු විට ඇය නැවතත් ෆැසිස්ට්වාදිනියක් වූවාය. මරනයට ගොදුරු වූ විට, ඇය ගැන කුමක් කියනු ඇත් ද?

ජොම සිසොන් හා අනෙකුත් සීපීපීයේ නිත්‍යානුකූල පෙරමුන වන ජාතික ප්‍රජාතන්ත්‍ර පෙරමුනෙහි නායකයෝ අගෝස්තු 2 මෙසේ ලියූහ. "මාකෝස්ගේ ඒකාධිපතිත්වයට එරෙහිව කැපීපෙනෙන සහ ආවේශජනක තැනැත්තියකි." සීපීපීයේ වෘත්තීය සමිති සංවිධානය වන කිලුසන්ග් මයො උනො (කේඑම්යූ) ලීයුවේ. "ඇය පිලිපීන මහජනතාවගේ මිතුරියක ලෙස මලේ ය. එඩ්සා මෙන්ම ඇය ද පිලිපීන ජනතාවගේ සමගියේ ශක්තිය ඓතිහාසික පිලිබිඹුවේ කොටස්කාරියක වූවා ය. අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජ වෙනස සඳහා සටන් කිරීමේ අවසන් නොවූ කර්තව්‍ය අඛන්ඩව සිදු කිරීම සඳහා පුලුල් සන්ධානයක් ගොඩ නගන ලෙස ඉතිහාසය විසින් අප කැඳවනු ලැබ ඇත." කිසිදු විවේචනයක් ඇත්තේ නැත.

කොරසොන් කොජුඅන්ග්කො අක්විනො "මහජන බලය" නියෝජනය කලේ නැත. පිලිපීනයේ ඉඩම් හිමි ධනපති පන්තියේ අවශ්‍යතාවයන් ඉෂ්ට කල ඇය ඇමරිකානු අධිරාජ්‍යවාදයේ උපකරනයකි. ඇය ඒකාධිපතිවාදයේ හතුරකු සහ ප්‍රජාතන්ත්‍රවාදයේ මාතාව ලෙස ප්‍රශංසා කිරීම පිලිපීන මෙන් ම ජාත්‍යන්තර කම්කරු පන්තියට මුසාවන් ඇද බෑමකි.

පසුගාමී රටවල සංයුක්ත විප්ලවවාදී හෝ ප්‍රගතිශීලි කර්තව්‍යයන්පවා ඉටු කිරීමට ජාතික ධනේශ්වරය ඓන්ද්‍රීයව අසමත් වෙති. ඔව්හු අධිරාජ්‍යවාදී ප්‍රාග්ධනය සමගත් ඉඩම් හිමියන් සමගත් ඉතා කිට්ටුවෙන් බැඳී සිටිති. මෙම කන්ඩායම් අතර ආතතීන් හට ගත්විට ඔවුහු ඒවා කම්කරු පන්තියට එරෙහි ඒකාබද්ධ එදිරිවාදීකම්වලට සහ භීතියට යටත් කරති.

පිලිපීනය මෙන් කල් පසුවී ධනවාදී සංවර්ධනයට ඇතුලු වූ රටවල ධනපති පන්තියට ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ එල්ලයන් කරා යා නොහැක. මෙම එල්ලයන් ජය ගත හැකි වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ආරම්භකත්වයන් පමනක් නොව, සමාජවාදී පියවරයන් ද ක්‍රියාවට දැමිය හැකි ගොවි ජනතාවගේ සහය ලත් කම්කරු පන්ති විප්ලවයක් මගින් පමනි. කම්කරුවන්ගේ පීඩිතයින්ගේ පුලුල් ජාත්‍යන්තර ව්‍යාපාරයක කොටසක් ලෙස පමනක් මිස ජාතික රාමුවක පදනම මත මෙම එල්ලයන් සම්පූර්න කල නොහැකිය.

එවන් විප්ලවවාදී අරගලයකට මග පෙන්වන ඉදිරිදර්ශනය ජාත්‍යන්තරවාදය මත පදනම් විය යුතු ය. පිලිපීනයේ ධනවාදී වර්ධනයේ මට්ටම භූගෝලීය ධනවාදයේ ඒකාබද්ධ වූත් අසම වූත් වර්ධනයේ කොටසකි. ආසියාව සහ ජාත්‍යන්තරව කම්කරු පන්තිය සහ පීඩිත ජනතාවගේ විමුක්තිය සඳහා ලෝක අධිරාජ්‍යවාදයට එරෙහි අරගලයේ කොටසක් ලෙස පිලිපීන ධනපති පන්තියට හා විශාල ඉඩම් හිමියන්ට එරෙහිව පිලිපීන කම්කරු පන්තිය දැනුවත් අරගලයක් කල යුතු ය.

නිර්ධන පන්තිය ජාත්‍යන්තර පන්තියකි, එහි කර්තව්‍ය භූගෝලීය වෙයි. සමාජවාදය සාක්ෂාත් කර ගත හැක්කේ ජාත්‍යන්තරව පමනි. එය සාර්ථක කර ගැනීමට නම්, කම්කරු පන්තික විප්ලවය ජාත්‍යන්තර විප්ලවයක් විය යුතුය.

"ජාතික ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය" සාර්ථක කර ගැනීමට ධනපති පන්තියේ කවර හෝ කොටසකට නිර්ධන පන්තිය යටත් කිරීම - "පුලුල්ම එකමුතුවක් ගොඩ නැගීම" - කම්කරු පන්තිය දරුනු පරාජයක් සඳහා සූදානම් කිරීමකි.

1986 දී නික් බීම්ස් තම ලිපිය අවසන් කල වචන එදා ඒවා ලියන ලද තත්ත්වය මෙන් අදටත් අදාල වෙයි.

"පිලිපීන කම්කරු පන්තියේ අනාගතය රඳා පවතින්නේ එය බලය කරා මෙහෙයවන විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගීම මතය. තම පන්ති අවශ්‍යතාවයන් සඳහා ක්‍රියා කිරීමට, තමන්ව ට්‍රොට්ස්කිවාදයේ ධජය යටතේ පිහිටුවීමට සහ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ පිලිපීන ශාඛාව ගොඩ නැගීමේ කර්තව්‍ය ආරම්භ කිරීම සඳහා පිලිපීන විප්ලවවාදීන්ට සහ සටන්කාමීන්ට අප කැඳවුම් කරන්නේ ඒ නිසා ය."

© www.wsws.org